*සැ. යු.-2010.04.16 වැනි දින පළ වූ අංක 1,650 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.*

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,651 - 2010 අප්‍රේල් මස 23 වැනි සිකුරාදා - 2010.04.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 492 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 492 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලු ම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 අප්‍රේල් මස 30 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 අප්‍රේල් මස 16 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂ්මන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

613 - B 079857 — 8845 (2010/04)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම්**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සැම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

“1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත”

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය:-

- (i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම.
- (ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
- (iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
- (iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
- (v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
- (vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මහනුවර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්‍ෂයටම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65 ට වැඩි නොවිය යුතු ය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2010 මැයි මස 21 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010ක් වූ මාර්තු මස 19 වැනි දින,
බත්තරමුල්ල,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/A3 හි
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මහනුවර | මැදදුම්බර | උඩසිය පත්තුව දකුණ කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ උඩදුම්බර කොට්ඨාසයේ විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර. |

04-480

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මාතර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්‍ෂයටම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65 ට වැඩි නොවිය යුතු ය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2010 මැයි මස 21 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010ක් වූ මාර්තු මස 19 වැනි දින,
බත්තරමුල්ල,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/A3 හි
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මාතර | වැලිගම | වැලිගම නගර කොට්ඨාසය උප්පැන්න හා මරණ (වෛද්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර. |

04-481

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — බදුල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65 ට වැඩි නොවිය යුතු ය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2010 මැයි මස 24 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010ක් වූ මාර්තු මස 22 වැනි දින,
බත්තරමුල්ල,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/A3 හි
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| බදුල්ල | පස්සර | බදුල්ල දිස්ත්‍රික්කයේ කණහෙල කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා යටිකිඳ කොට්ඨාසයේ විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල. |

04-482

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — ගාල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65 ට වැඩි නොවිය යුතු ය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2010 මැයි මස 21 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මඟින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2010 මාර්තු මස 17 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ගාල්ල | කරන්දෙණිය | ඌරගස්මන්හන්දිය කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා බෙන්තර වලල්ලාවිට කෝරළ කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල |

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ගාල්ල | බෝපේ-පෝද්දල | හපුගල කොට්ඨාශයේ උප්පැන්න, මරණ සහ ගාල්ල කඩවත් සතර කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය ) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල |
| -එම- | නාගොඩ | යටලමත්ත කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ ගඟබඩ පත්තුව කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය ) රෙජිස්ට්‍රාර් ධුරය | -එම- |
| -එම- | ඇල්පිටිය | පිටිගල කෝට්ඨාසයේ උප්පැන්න, මරණ සහ බෙන්තර වලල්ලාවිට කෝරළ කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | -එම- |
| ගාල්ල | හික්කඩුව | වැල්ලබඩ පත්තුව (දොඩන්දූව) කොට්ඨාසයේ අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල. |
| -එම- | ගාල්ල කඩවත් සතර | ගාල්ල නගරය මහමෝදර රජයේ මහරෝහල කොට්ඨාසයේ උප්පැන්න මරණ රෙජිස්ට්‍රාර් ධුරය | -එම- |

04-483

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුළත්වීම සඳහා පැවැත්වෙන තරග විභාගය - 2010
**(2011/2013 කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව)**

2011/2013 දැවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීමේ තරග විභාගයක් විභාග දෙපාර්තමේන්තුව මගින් සිංහල හා දෙමළ මාධ්‍යවලින් 2010 ජූලි මස 31 වැනිදා පහත සඳහන් නගරවල පිහිටුවනු ලබන මධ්‍යස්ථානවල පවත්වනු ලැබේ.

| *නගර අංකය* | *නගරය* |
|---|---|
| (1) | අනුරාධපුරය |
| (2) | බදුල්ල |
| (3) | මඩකලපුව |
| (4) | කොළඹ |
| (5) | ගාල්ල |
| (6) | යාපනය |

| *නගර අංකය* | *නගරය* |
|---|---|
| (7) | මහනුවර |
| (8) | කුරුණෑගල |
| (9) | මාතර |
| (10) | ත්‍රිකුණාමලය |
| (11) | වවුනියාව |
| (12) | රත්නපුරය |
| (13) | හම්බන්තොට |

කිසියම් මධ්‍යස්ථානයක් සඳහා අවශ්‍ය තරම් විභාග අපේක්ෂකයන් අයැදුම් කොට නොමැති විට ඔවුන්ගේ දෙවැනි කැමැත්ත අනුව හෝ අයැදුම් කොට ඇති මධ්‍යස්ථානයට සමීප වෙනත් මධ්‍යස්ථානයක් හෝ ඔවුන්ට නියම කෙරෙනු ඇත. විභාගය සඳහා ඉල්ලුම් කළ නගරය/නගර පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. විභාගයට පෙනී සිටීම සඳහා ඉල්ලුම් කරන මාධ්‍යය ද පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

02. *දැවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව*

2.1 කෘෂිකර්මය පිළිබඳ මෙම පාඨමාලාව ගැහැණු - පිරිමි දෙපක්ෂයටම විවෘතය. මෙම විභාගයෙන් හා සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූ අය කුසලතාව හා දිස්ත්‍රික් පදනම මත කුණ්ඩසාලේ, කරපිංච, පැල්වෙහෙර, අඟුණකොළපැලැස්ස සහ වවුනියාව යන කෘෂිකර්ම විද්‍යාල පහට තෝරාගනු ලැබේ.

2.2 ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවල පවත්වනු ලබන කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි කර ඇත. මෙම පුහුණුව හුදෙක් වෘත්තීයමය වන අතර, එය පිළියෙල කරනු ලැබ ඇත්තේ පුහුණුවෙන් පසු ස්වයං

රැකියාවල යෙදීමට හෝ සුදුසු රැකියාවක් ලබා ගැනීමට හෝ බලාපොරොත්තු වන ශිෂ්‍යයනට හා ශිෂ්‍යාවනටය. පාඨමාලාව හදාරන කාලය තුළ දී නේවාසිකව නැවතී සිටීම අනිවාර්ය වේ. ඔවුනට මෙම කාලය තුළ දී වෙනත් කිසිදු ආයතනයක පූර්ණ කාලීන හෝ අර්ධ කාලීන පුහුණු පාඨමාලාවක් හැදෑරීමට හෝ රැකියාවක් ලබා ගැනීමට හෝ අවසර දෙනු නොලැබේ. කිසියම් ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක කිසියම් අවස්ථාවක එවැනි පාඨමාලාවක් හදාරන බව හෝ වෙනත් කිසියම් ආයතනයක රැකියාවක නියුක්ත බව හෝ ඔප්පු වුවහොත් ඔහු /ඇය කෘෂිකර්ම විද්‍යාලයෙන් නෙරපනු ලැබේ.

2.3 සෙනසුරාදා සහ ඉරිදා දිනවල ද සමහර විට පන්ති පවත්වන බැවින් නේවාසිකාගාරවලින් බැහැරව යා හැක්කේ මසකට එක් සති අන්තයක දී පමණය. මඩ කුඹුරුවල, ගොඩ ගොවිතැන්වල ප්‍රායෝගිකව යෙදීමට මනාපයක් තිබිය යුතුය. මෙම පුහුණුවෙන් පසු රැකියා අවස්ථාවන් වැඩි වශයෙන් බලාපොරොත්තු විය හැක්කේ වියලි කලාපයේ ගම්බද පළාත්වල බැවින් එම ප්‍රදේශවල සේවය කිරීමට අයදුම්කරුවන්ට කැමැත්තක් තිබිය යුතුය. පුහුණුවෙන් පසු රැකියා ලබාදීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හෝ රජය කිසිම ආකාරයකින් බැඳී නැත. රාජ්‍ය අංශයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවේ කෘෂිකර්ම උපදේශක ආදී තනතුරු කීපයකට හා වෙනත් රාජ්‍ය අංශයේ සමහර තනතුරු සඳහා අයදුම් කිරීමට කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාවට අමතරව අ.පො.ස. (උසස් පෙළ) ජීව විද්‍යා විෂය ධාරාවෙන් විෂයයන් 03ක් එකවර සමත්වීම අවශ්‍යවේ.

03. *ඇතුළත්වීම සඳහා තිබිය යුතු සුදුසුකම් :*

3.1 (*අ*) සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව යන විෂයන් තුනට අනිවාර්යෙන් සම්මාන සාමාර්ථ ද, සමාජ අධ්‍යයනය හෝ කෘෂිකර්මය යන විෂයන් දෙකෙන් එකකටවත් සම්මාන සාමාර්ථය ඇතිව (මේ අනුව සම්පූර්ණයෙන් සම්මාන හතරක් (04) තිබිය යුතුය.) දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයන් 06ක් අ. පො. ස. (සා. පෙ.) සමත් වී තිබිය යුතුය. මෙහිදී එක් වරක දී විෂයන් තුනකට සම්මාන සහිතව අවම වශයෙන් විෂයන් 05ක් එකවර සමත්වී තිබීම;

*සහ*

අ. පො. ස. (උසස් පෙළ) විභාගයේ දී ජීව විද්‍යා අංශයෙන් විෂය ධාරාව හදාරා උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සත්ත්ව විද්‍යාව, කෘෂිකර්මය, ජීව විද්‍යාව යන විෂයයන් හයෙන් තුනක් එක්වරකදී සමත්වී තිබීම (මෙම සුදුසුකම ඇති සිසුන් තෝරා ගැනීමේ දී ප්‍රමුඛතාවක් ලබාදෙනු ලැබේ.);

*හෝ*

(*ආ*) සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් තුනට අනිවාර්යයෙන් සම්මාන සාමාර්ථ ද, සමාජ අධ්‍යයනය හෝ කෘෂිකර්මය යන විෂයන් දෙකෙන් එකකටවත් සම්මාන සාමාර්ථය ඇතිව (මේ අනුව සම්පූර්ණයෙන් සම්මාන හතරක් (04) තිබිය යුතුය) දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06ක් අ. පො. ස. (සා. පෙළ) සමත්ව තිබිය යුතුය. මෙහිදී එක්වරකදී විෂයයන් 03කට සම්මාන සහිතව අවම වශයෙන් විෂයයන් 05 ක් එකවර සමත් වී තිබීම;

*සහ*

අ. පො. ස. (උසස් පෙළ) විභාගයේදී ජීව විද්‍යා අංශයෙන් විෂය ධාරාව හදාරා උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සත්ත්ව විද්‍යාව, කෘෂිකර්මය, ජීව විද්‍යාව යන විෂයයන් හයෙන් විෂයයන් එකක් හෝ දෙකක් සමත්වී තිබීම (උසස් පෙළ සඳහා ගණිතය විෂය ධාරාව හැදෑරූ සිසුන් රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව සමත් වී සිටීම මෙම පාඨමාලාවට සුදුසුකම් ලැබුවා සේ නොසැලකේ.) මෙම සුදුසුකම් ඇති අයදුම්කරුවන් තෝරාගනු ලබන්නේ 3.1 (අ) හි අයදුම්කරුවන් සියලුම දෙනා තෝරා ගැනීමෙන් පසුව පුරප්පාඩු ඇතොත් පමණි;

(*ඇ*) ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාව හදාරන්නේ නම් අ. පො. ස. (සා. පෙ.) ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් තිබිය යුතුය.

3.2 2010.05.31 වැනි දිනට අපේක්ෂකයාගේ වයස අවුරුදු 17ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 25ට වැඩි නොවිය යුතුය. රජයේ සේවයේ නියුතු අය මෙම තරග විභාගයට පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

3.3 3.1 හා 3.2 හි සඳහන් ඇතුළත්වීම සඳහා තිබිය යුතු සුදුසුකම් සැලකිලිමත්ව කියවා බැලීමට අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් සපුරා නොමැති හා/හෝ නියමිත වයස් සීමාවෙන් බැහැර වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

3.4 ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් අයදුම්පත් එවීම නොකළ යුතුයි. දැනට රජයේ දෙපාර්තමේන්තුවක හෝ ආයතනයක දෑවුරුදු කෘෂිකර්ම පාඨමාලාවන් හදාරන සිසුන් මෙම පාඨමාලාව හැදෑරීමට අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

3.5 කෘෂිකර්ම විද්‍යාලයේ උගන්වන මාධ්‍ය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි බැවින් එම භාෂාවන් අතුරින් එක් භාෂාවකින් එම පාඨමාලාව හදාරා පාඨමාලාවේ විභාගයන්ට පෙනී සිටීමට අපේක්ෂකයාට හැකි විය යුතුය. තෝරාගත් මාධ්‍යයෙන් දිගටම අධ්‍යයන කටයුතු කළ යුතුය. පාඨමාලාව අතර මගදී ඉගෙනුම ලබන මාධ්‍යය වෙනස් කළ නොහැක.

3.6 ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වනු ලබන්නේ කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ පමණි. ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙන ගැනීමට බලාපොරොත්තු වන අයදුම්කරුවනට තරග විභාගය සඳහා තමන් කැමති මාධ්‍යයකින් පෙනී සිටිය හැක. එහෙත් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තුවන අයදුම්කරුවන් I වන හා II වන ප්‍රශ්න පත්‍රවලට අමතරව III වන ප්‍රශ්න පත්‍රය වන ඉංග්‍රීසි භාෂා ප්‍රශ්න පත්‍රයට ද පෙනී සිටිය යුතුය. ඉංග්‍රීසි මාධ්‍යය සඳහා බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව 30 කි. පාඨමාලාව සඳහා තෝරා ගනු ලබන සෑම ශිෂ්‍යයෙකුම ආරම්භයේ දී තමන් විසින් තෝරා ගන්නා ලද මාධ්‍යයෙන් අධ්‍යාපන කටයුතු හා විභාග කටයුතු කළ යුතු අතර පසු අවස්ථාවක දී ඉගෙන ගන්නා මාධ්‍යය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

04. *අයදුම්පත් :*

4.1 මෙම දැන්වීම අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය ප්‍රකාර අයදුම්කරුවන්ගේ අත් අකුරුවලින් හෝ යතුරු ලියනය කර 8"x 12" ප්‍රමාණයේ (A 4 ප්‍රමාණයේ) කඩදාසියක දෙපැත්තේ තම අයදුම්පත සකස් කළ යුතුය. ඉල්ලුම් පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදිය යුතුවේ. එහි අංක 01 සිට අංක 10 තෙක් මුල් පිටුවේ ද 11 සිට 14 තෙක් දෙවන පිටුවේ ද, ඉතිරිය 3 වන පිටුවේ ද සඳහන් කළ යුතු වේ. අසම්පූර්ණව පුරවා ඇති හා ආදර්ශ ආකෘතිය අනුව සකස් නොකළ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. තමන් සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය විභාග සම්බන්ධ ගැසට් නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු/කාරිය විමසා බැලිය යුතුවේ. ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් තමන් ළඟ තබාගත යුතුවේ.

4.2 විභාග ගාස්තුව ලෙස විභාග කොමසාරිස් ජනරාල්ගේ 20-03-20-13 ආදායම් ශීර්ෂයට බැරවන සේ දිවයිනේ ඕනෑම දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත් රුපියල් 300ක් වටිනා ලදුපතක් ලබාගෙන නොගැලවෙනසේ අයදුම්පතේ අදාළ ස්ථානයට ඇලවිය යුතුය. ලදුපතේ ඡායා පිටපතක් තමා වෙත තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කිසිදු හේතුවක් නිසා හෝ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගයට ගෙවන ලද ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කළ නොහැක. විභාග ගාස්තුවල ලදුපතක් අයදුම්පත් සමග ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත.

4.3 සියලුම අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පමණක් 2010 මැයි මස 31 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ, ව්‍යාප්ති හා පුහුණු අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය යන ලිපිනයට එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී ප්‍රමාද වන හෝ නැතිවන හෝ අයදුම්පත් ගැන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වගකීම් දරනු නොලැබේ.

4.4 අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "2011/2013 කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුළත් වීම" යන්න හා පළමුවන හා දෙවන තේරීම් වශයෙන් තෝරා ඇති විභාග පැවැත්වෙන නගරවල නම් පැහැදිලිව සඳහන් කරන්න. විභාගය සඳහා ඉල්ලුම් කළ විභාග මධ්‍යස්ථානය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

05. *තෝරා ගැනීමේ පිළිවෙල :*

5.1 බඳවා ගන්නා වර්ෂය තුළ දී එක් එක් මාධ්‍යයෙන් සියලුම කෘෂිකර්ම විද්‍යාලවලට බඳවා ගන්නා මුළු සංඛ්‍යාව සොයාගෙන අයදුම්කරුවන් සිටින දිස්ත්‍රික්කවලට එක් එක් මාධ්‍යයෙන් ඇතුළත් කරගනු ලබන සංඛ්‍යාව තීරණය කරගනු ලැබේ. ඉන්පසුව එක් එක් මාධ්‍ය සඳහා දිස්ත්‍රික්කයට අයත් අයදුම්කරුවන් අතරින් තරග විභාගයේ ලබාගත් ලකුණු පදනම් වූ කුසලතාවන් මත වැඩිම කුසලතාවයන් පෙන්නූ අයදුම්කරුවන් හෝ අයදුම්කාරියන් තෝරාගනු ලැබේ. එසේ තේරීමේ දී පහත සඳහන් කරුණු ද සැලකිල්ලට ගනු ලැබේ.

අ. පො. ස. (සා. පෙළ) විභාගයට පළමු වන වරට පෙනී සිටි දිස්ත්‍රික්කය අයදුම්කරු හෝ අයදුම්කාරිය අයත් දිස්ත්‍රික්කය ලෙස සලකනු ලැබේ. අ. පො. ස. (සා. පෙළ) විභාගයට පළමුවන වරට පෙනී සිටි දිස්ත්‍රික්කයට අදාළ අංකය සොයා ගැනීම සඳහා මෙම ගැසට් නිවේදනයේ අවසානයට පළකර ඇති ඇමුණුමේ අංක 01 උපයෝගී කරගත යුතුවේ.

5.2 ලිඛිත විභාගය සඳහා වූ විෂයයන් හා කාල සටහන පහත සඳහන් වේ :

| *විෂයයන්* | *කාලය* | *කාල සටහන* |
|---|---|---|
| 01. කෘෂිකර්මය (ලකුණු 100 යි)<br>(අ. පො. ස (සා. පෙළ) කෘෂිකර්ම විෂයය නිර්දේශ මට්ටම ආශ්‍රිතව සකස් කළ බහුවරණ හා කෙටි ප්‍රශ්න අඩංගු වේ.) | පැය 1 යි | 09 30 පැය - 10 30 පැය |
| 02. බුද්ධි පරීක්ෂණය (ලකුණු 100යි) | පැය 1 යි | 11 00 පැය - 12 00 පැය |
| 03. ඉංග්‍රීසි භාෂාව (ලකුණු 100යි)<br>අ. පො. ස. (සා. පෙළ) ඉංග්‍රීසි විෂය නිර්දේශ | පැය 1 යි | 13 30 පැය - 14 30 පැය |

| *විෂයයන්* | *කාලය* | *කාල සටහන* |
|---|---|---|
| මට්ටම ආශ්‍රිතව සකස් කෙරේ. ඉංග්‍රීසි භාෂාවෙන් කරුණු අවබෝධ කර ගැනීම, ඉංග්‍රීසියෙන් අදහස් සංනිවේදනය කිරීමේ හැකියාවන් හා සරල ව්‍යාකරණ හැකියාවන් පරීක්‍ෂා කෙරේ. (මෙම ප්‍රශ්න පත්‍රය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන්ට පමණි) | | |

5.3 විභාගයට කෘෂිකර්මය හා බුද්ධි පරීක්‍ෂණය යනුවෙන් ප්‍රශ්න පත්‍ර දෙකකි. එම ප්‍රශ්න පත්‍ර දෙකේ ලකුණුවල එකතුව අනුව වැඩිම ලකුණු ලබා ගන්නා අපේක්‍ෂකයින් දිස්ත්‍රික් පදනමින් තෝරාගෙන සම්මුඛ පරීක්‍ෂණයට කැඳවනු ලැබේ. එහිදී අ. පො. ස. (උ. පෙළ) ජීව විද්‍යා විෂයය ධාරාව හදාරා විෂයයන් 03කින් එකවර සමත් වූ හා තරග විභාගයේ විෂයයන් දෙකේ එකතුව අනුව වැඩිම ලකුණු ලබාගෙන කුසලතාවන් දැක් වූ අයට ප්‍රමුඛතාවන් දෙමින් ඒ අය පළමුව තෝරාගනු ලැබේ. යම් දිස්ත්‍රික්කයකින් යම් මාධ්‍යයක් සඳහා එවැනි අයදුම්කරුවන් නොමැති විට හෝ එවැනි අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති විටදී පමණක් එම දිස්ත්‍රික්කයෙන් එම මාධ්‍යය සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව සම්පූර්ණ වනසේ අ.පො.ස. (උ.පෙළ) විෂයයන් එකක් හෝ දෙකක් සමත් අයදුම්කරුවන් අතරින් තරග විභාගයේ විෂයයන් දෙක සඳහා වැඩිම ලකුණු ලබාගෙන කුසලතාව දැක්වූ අයදුම්කරුවන් තෝරාගනු ලැබේ. මෙම තෝරා ගැනීම අනිවාර්යයෙන්ම 5.1 හි සඳහන් ආකාරයට දිස්ත්‍රික්ක පදනමින් හා විභාගයේ දී දැක් වූ කුසලතාවන් අනුව කෘෂිකර්ම අධ්‍යක්‍ෂ ජනරාල් අනුමත කර ඇති ක්‍රමයක් අනුව සිදු කෙරේ. අදාළ වර්ෂයේ දී එක් එක් කෘෂිකර්ම විද්‍යාලයට ඇතුළත් කරගනු ලබන පිරිමි හා ගැහැණු සිසුන් සංඛ්‍යාව එම විද්‍යාලවල පිරිමි හා කාන්තා නේවාසිකාගාරවල ඇති ඉඩකඩ අනුව හා එම විද්‍යාලවල ඇති පුහුණු පහසුකම් අනුව තීරණය කරනු ඇත. මේ නිසා තෝරා ගැනීමට සලකා බලන තරග විභාගයේ විෂයයන් දෙකේ ලකුණුවල එකතුවේ කඩඉම් ලකුණු මට්ටම් දිස්ත්‍රික්කයක පිරිමි හා ගැහැණු අයදුම්කරුවන් අතර හා පාඨමාලාව හදාරන එක් එක් මාධ්‍යය අනුව වෙනස් වේ. කිසියම් දිස්ත්‍රික්කයකට තෝරා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති විට දී විද්‍යාලවලට එක් එක් මාධ්‍යයට උපරිම සිසුන් ප්‍රමාණයක් ඇතුළත් කිරීම සඳහා අනිකුත් දිස්ත්‍රික්කවලින් අවශ්‍ය සිසුන් සංඛ්‍යාව තෝරාගනු ලැබේ.

ඉහත සඳහන් කරුණු සලකා බලමින් දිස්ත්‍රික්කයේ විෂයයන් දෙක සඳහා වැඩිම ලකුණු සංඛ්‍යාවක් ලබාගත් සිසුන් සීමිත ප්‍රමාණයක්, ඔවුන්ගේ අධ්‍යාපනික සහතික හා වෙනත් සහතික හෝ පරීක්‍ෂා කිරීමට සම්මුඛ පරීක්‍ෂණයකට කැඳවනු ඇත. අයදුම්පතේ සඳහන් සහතිකවල මුල් පිටපත් මෙහිදී පරීක්‍ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්‍ෂණයට ලකුණු ලබාදෙනු නොලැබේ. කෘෂිකර්ම විද්‍යාලවලට තෝරාගනු ලබන සිසුන් සංඛ්‍යාවට වඩා වැඩි සිසුන් ප්‍රමාණයක් සම්මුඛ පරීක්‍ෂණයට කැඳවනු ලැබේ.

5.4 සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් අනිවාර්යයෙන් තමන් පාඨමාලාව හැදෑරීමට තෝරාගත් භාෂා මාධ්‍යයෙන්ම තරග විභාගයේ දී පළමුවන හා දෙවන ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුතුය. ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාව හැදෑරීමට අයදුම් කරන අයදුම්කරුවන් පමණක් තම මනාපය අනුව සිංහලෙන් හෝ දෙමළෙන් පළමුවන හා දෙවන ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය හැකිය. ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන සිසුන් පමණක් ඒ සඳහා සුදුසුකම් ලැබීමට ඉංග්‍රීසි භාෂා ප්‍රශ්න පත්‍රයට පෙනී සිට, අවම වශයෙන් 40%ක් ලකුණු ලබාගත යුතු වේ. ඉංග්‍රීසි විෂයය සමත් අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොසිටින අවස්ථාවල දී පමණක් මෙම අවම සීමාවන් වෙනස් කිරීමට ඉඩ ඇත. ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා කුසලතාව මත හා අනුමත කර ඇති ක්‍රමයක් අනුව හැකිතාක් දුරට දිස්ත්‍රික් පදනම මත තේරීම සිදුකරනු ලැබේ. එහිදී ඉංග්‍රීසි භාෂා ප්‍රශ්න පත්‍රයට, අවම සුදුසුකම් සපුරා ඇති අපේක්‍ෂකයින් අතරින් පළමුවන ප්‍රශ්න පත්‍රය හා දෙවන ප්‍රශ්න පත්‍රයේ ලකුණුවල එකතුව අනුව වැඩිම ලකුණු ලබාගෙන ඇති අපේක්‍ෂකයින් පමණක් කුසලතා මත තෝරාගනු ලැබේ. ඉංග්‍රීසි මාධ්‍යයට නොතේරෙන අයදුම්කරුවන් ඔවුන් තරග විභාගයේ දී පෙන්නුම් කළ කුසලතා මත ඔවුන් අයත් දිස්ත්‍රික්කයෙන් සිංහල හෝ දෙමළ මාධ්‍යයන්ට ඇතුළු කිරීමට සලකා බලනු ලැබේ. අයදුම්කරුවෙකු විසින් විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන ලද මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

5.5 3.1 සහ 3.2 ඡේදයන්හි සඳහන් සුදුසුකම් ඇති සියලුම අයදුම්කරුවන්ට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ප්‍රවේශ පත්‍ර එවනු ලැබේ. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාවේ ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම කරන ලිපියේ ඡායා පිටපතක් ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ප්‍රවේශපත්‍රය නොලැබීම දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත. අපේක්‍ෂකයන්ට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකේ.

5.6 විභාගය පැවැත්වෙන අවස්ථාවේ දී අයදුම්කරුවන් විසින් තම අනන්‍යතාව විභාග ශාලාධිපති වෙත ඔප්පු කර සිටිය යුතුයි. මේ සඳහා පහත දැක්වෙන ලියකියවිලිවලින් එකක් පමණක් පිළිගනු ලැබේ :—

(අ) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;
(ආ) විභාග දිනයට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුළත නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රයක්.

5.7 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ප්‍රසිද්ධ ලිඛිත විභාගවලට බලපාන නීති හා කොන්දේසිවලට අයදුම්කරුවන් යටත් වේ. එම නීතිරීති හා කොන්දේසි උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සිසුන් ලබාගත් ලකුණු ඔවුන්ගේ ලිපිනයන්ට දන්වා එවනු ඇත. දිස්ත්‍රික් මට්ටමින් වැඩිම ලකුණු ලබාගත් සිසුන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ඇත. මෙම ලිඛිත විභාගයට පෙනී සිටීමට ඉඩදීම හෝ සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමට ඉඩදීම අපේක්ෂකයාගේ සුදුසුකම් පිළිගත් බවක් නොහැඟේ. විභාගයට පෙර හෝ එය පවත්වන අතර හෝ ඉන් පසුව හෝ යන කවර අවස්ථාවක දී වුවත් මෙම ව්‍යවස්ථාවන් අනුව නුසුදුසු යැයි තීරණය වන අයදුම්කරුවකුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

5.8 ලිඛිත විභාගයට හෝ සම්මුඛ පරීක්ෂණයට හෝ ඒ දෙකටම හෝ පෙනී සිටීම වෙනුවෙන් රජය විසින් අපේක්ෂකයින්ට කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

06. *"කුසුමා ලක්ෂමී කරුණාතිලක" සිහිවටන ශිෂ්‍යත්වය :*

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයේ දී I වැනි හා II වැනි ප්‍රශ්න පත්‍ර දෙකේ එකතුව අනුව වැඩිම ලකුණු ලබා ගත් ඕනෑම මාධ්‍යයක අයදුම්කාරියකට ඉහත ශිෂ්‍යත්වයේ කොන්දේසිවලට යටත්ව වර්ෂ දෙකක් සඳහා මෙම ශිෂ්‍යත්වය ප්‍රදානය කරනු ලැබේ. ශිෂ්‍යත්වලාභිණියට කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලයේ ඉගෙනුම ලැබීමට අවස්ථාව දෙනු ලැබේ. මෙම ශිෂ්‍යත්වයේ වාර්ෂික වටිනාකම රු. 10,000 ක් වේ.

ආචාර්ය ජිනාදරී ද සොයිසා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

2010 මාර්තු මස 31 වැනි දින,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

**ඇමුණුම් අංක 01**
දිස්ත්‍රික්කවල නම් හා ඒවාට අයත් අංක
(5.1 ඡේදයට අදාළ වේ)

| *දිස්ත්‍රික් අංක* | *දිස්ත්‍රික්කය* |
|---|---|
| 01 | අනුරාධපුරය |
| 02 | බදුල්ල |
| 03 | මඩකලපුව |
| 04 | කොළඹ |
| 05 | ගාල්ල |
| 06 | යාපනය |
| 07 | මහනුවර |
| 08 | කුරුණෑගල |
| 09 | මාතර |
| 10 | ත්‍රිකුණාමලය |
| 11 | වව්නියාව |
| 12 | රත්නපුරය |
| 13 | හම්බන්තොට |

| *දිස්ත්‍රික් අංක* | *දිස්ත්‍රික්කය* |
|---|---|
| 14 | ගම්පහ |
| 15 | කළුතර |
| 16 | මාතලේ |
| 17 | නුවරඑළිය |
| 18 | මන්නාරම |
| 19 | මුලතිව් |
| 20 | අම්පාර |
| 21 | පුත්තලම |
| 22 | පොලොන්නරුව |
| 23 | මොණරාගල |
| 24 | කෑගල්ල |
| 25 | කිලිනොච්චිය |

*ආදර්ශ ඉල්ලුම් පත්‍රය*

*ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුළත් වීම සඳහා පැවැත්වෙන තරග විභාගය - 2010*

*(2011/2013 කෘෂිකර්ම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව)*

(COMPETITIVE EXAMINATION FOR ADMISSION TO SRI LANKA SCHOOL OF AGRICULTURE - 2010
(DIPLOMA IN AGRICULTURE 2011-2013)

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

1.
| විභාගයට පෙනී සිටින නගරය | එහි අංකය |
|---|---|
| 1 වැනි තේරීම .......... | .......... |
| 2 වැනි තේරීම .......... | .......... |

(ගැසට් පත්‍රයේ මුල් ඡේදයට අනුව)

2. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
සිංහල මාධ්‍ය - 2
දෙමළ මාධ්‍ය - 3

...............

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3. පාඨමාලාව හැදෑරීමට කැමති මාධ්‍ය :
සිංහල මාධ්‍ය - 2
දෙමළ මාධ්‍ය - 3
ඉංග්‍රීසි මාධ්‍ය - 4

..................

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4. ස්ත්‍රී/පුරුෂ භාවය :
පුරුෂ - 0
ස්ත්‍රී - 1

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

5. සාමාන්‍ය පෙළ විභාගයට ප්‍රථම වරට පෙනී සිටි පාසල පිහිටි දිස්ත්‍රික්කය
..................

දිස්ත්‍රික් අංකය
............

(5.1 ඡේදයට අනුව/ඇමුණුම 01 බලන්න)

6.
| අ. පො. ස. (උසස් පෙළ) ජීව විද්‍යා විෂය ධාරාව හදාරා සමත් වී ඇති විෂයයන් ගණන (අදාළ අංකය කොටුව තුළ ලියන්න) | |
|---|---|
| විෂයයන් තුනක් එකවර | - 3 |
| විෂයයන් දෙකක් හෝ එකක් එකවර | - 2 |

සමත් වූ විෂයයන් ගණනට අදාළ අංකය
..................

(3.1 ඡේදයට අනුව)

7. (අ) (i) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :—————.
(පැහැදිලි අකුරින්)

(ii) අගට යෙදූ මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්) :—————.
උදා : ANANDA, K. C. B.

(ආ) (i) මුලකුරුවලින් හැඳින්වෙන නම් :—————.

(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්) :—————.

8. (i) සම්පූර්ණ ලිපිනය :—————.

(ii) විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු සම්පූර්ණ ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්) :—————.

(iii) සම්බන්ධ කරගත හැකි දුරකථන අංකය (ඔබගේ හෝ ඔබට දුරකථන පණිවිඩයක් දිය හැකි අංකයක්) :—————.

9. (අ) අ. පො.ස. (සා. පෙළ.) විභාගයට පළමුවනවරට පෙනී සිටි පාසල හා ලිපිනය :—————.

(ආ) පළමුවනවරට අ. පො. ස. (සා. පෙළ) විභාගයට පෙනී සිටි පාසල අයත් දිස්ත්‍රික්කය (සිංහලෙන්) :—————.

(ඇ) පළමුවනවරට අ. පො. ස. (සා. පෙළ) විභාගයට පෙනී සිටි පාසල අයත් දිස්ත්‍රික්කය (ඉංග්‍රීසියෙන්) :—————.

10. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

11. (අ) පදිංචි මැතිවරණ කොට්ඨාසය (සිංහලෙන්) :—————.

(ආ) මැතිවරණ කොට්ඨාසය (ඉංග්‍රීසියෙන්) :—————.

12. උපන් දිනය : අවුරුද්ද : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

13. 2010.05.31 වැනි දිනට වයස : අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

14. ගැසට් නිවේදනයේ සඳහන් විස්තර අනිවාර්යෙන් කියවා මෙම කොටස පිරවිය යුතුවේ.

(අ) නිවේදනයේ 3.1 ඡේදය අනුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයන් හය හෝ ඊට වැඩි ගණන :

| විභාග අංකය | වර්ෂය සහ මාසය | සමත් විෂයයන් | විෂයය අංකය | සමත් ශ්‍රේණිය |
|---|---|---|---|---|
| | | සිංහල | | |
| | | ගණිතය | | |
| | | විද්‍යාව | | |
| | | කෘෂිකර්මය | | |
| | | සමාජ අධ්‍යයනය | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

(ආ) ගැසට් නිවේදනයේ 3.1 ඡේදය අනුව සම්මාන සාමාර්ථයන් ලබාගැනීම අනිවාර්ය කර ඇති විෂයයන් හතර පිළිබඳ විස්තර :

| විභාග අංකය | වර්ෂය සහ මාසය | සමත් විෂයයන් | විෂයය අංකය | සමත් ශ්‍රේණිය |
|---|---|---|---|---|
| 1. | | 1. සිංහල | | |
| 2. | | 2. ගණිතය | | |
| 3. | | 3. විද්‍යාව | | |
| 4. | | 4. කෘෂිකර්මය | | |
| 5. | | 5. සමාජ අධ්‍යයනය | | |

(ඇ) අ. පො. ස. (උ. පෙ.) විභාගය ජීව විද්‍යා විෂය ධාරාවන් හදාරා ඇත් ද? ඔව්/නැත (අදාළ නොවන වචනය කපා හරින්න.)

(ඈ) අ. පො. ස. (උ. පෙ.) විභාගයෙන් සමත් විෂයයන් :

| විභාග අංකය | වර්ෂය සහ මාසය | සමත් විෂයයන් | විෂයය අංකය | සමත් ශ්‍රේණිය |
|---|---|---|---|---|
| | | 1. ජීව විද්‍යාව | | |
| | | 2. කෘෂිකර්මය | | |
| | | 3. භෞතික විද්‍යාව | | |
| | | 4. රසායන විද්‍යාව | | |
| | | 5. සත්ත්ව විද්‍යාව | | |
| | | 6. උද්භිද විද්‍යාව | | |

(ඉ) ඉහත සඳහන් සුදුසුකම් සනාථ කිරීම සඳහා අධ්‍යාපන සහතිකවල ඡායා පිටපත් ඉල්ලුම් පත්‍රයට අමුණා එවන්න.
(මුල් පිටපත් එවිය යුතු නොවේ.)

සහතිකවල ඡායා පිටපත් අමුණා තිබේ ද? :————.

15. (i) දෙමව්පිය හෝ භාරකරුගේ නම සහ ලිපිනය :————.
(ii) දෙමව්පිය හෝ භාරකරුගේ නම සහ ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්)

16. මුදල් ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :————.
16.1 ලදුපතේ අංකය හා දිනය :————.
16.2 ලදුපත ලබාගත් දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.

| |
|---|
| මුදල් ගෙවූ ලදුපතේ උඩ කොටසේ තීරුවක පමණක් මැලියම් ගා මෙහි අලවන්න.<br>ලදුපතේ ඡායා පිටපතක් අනිවාර්යෙන්ම ඔබ ළඟ තබාගන්න. |

*අයැදුම්කරුගේ ප්‍රකාශය :*

මා විසින් මෙම අයැදුම්පතෙහි සඳහන් කර ඇති විස්තර සත්‍ය බවත්, නිවැරදි බවටත් මෙයින් සහතික කරමි. අ. පො. ස. (සා. පෙ.) සමත් බවත්, සිංහල, විද්‍යාව, ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථයන් ඇති බවත්, සමාජ අධ්‍යයනය හෝ කෘෂිකර්මය යන විෂයන් දෙකකින් එකකට සම්මාන සාමාර්ථයක් ඇති බවත් හා උසස් පෙළ ජීව විද්‍යා විෂය ධාරාවන් හදාරා ගැසට් නිවේදනයේ නම් කර ඇති සියළුම සුදුසුකම් ඇති බවට සහතික වෙමි. මෙහි සඳහන් කරුණු අසත්‍ය බව හෝ වැරදි බව හෝ හෙළි වුවහොත්, මා තරග විභාගයට පෙනී සිටීමට හා කෘෂිකර්ම විද්‍යාලයට තෝරා ගැනීමට නුසුදුස්සෙකු වන බව මම දනිමි. මෙම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති පිළිපැදීමට මම එකඟ වෙමි.

————,
අයැදුම්කරුගේ අත්සන.

දිනය :————.

**අධ්‍යාපන සුදුසුකම් හා අත්සන සහතික කිරීම**

(දෙපාර්තමේන්තුවක හෝ පාසලක ප්‍රධානියෙක්, සාමදාන විනිශ්චකාරවරයෙක්, නීතිඥයෙක් හෝ රුපියල් 2,30,060 ක් හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියෙකු විසින් මෙම අයැදුම්පත්‍රය සහතික කළ යුතුයි.)

ඉහතින් අත්සන් කර ඇති ................................ මයා/මිය/මෙනෙවිය මා හොඳින් දන්නා හඳුනන බවත්, ඔහු/ඇය මා ඉදිරිපිටදී අත්සන් යෙදූ බවත් මෙයින් සහතික කරමි. තවද, ***ගැසට් නිවේදනයේ* සඳහන් අ. පො. ස. (සා. පෙළ) හා අ. පො. ස. (උසස් පෙළ) සුදුසුකම් ඇති බවට *ගැසට් නිවේදනය* හා අධ්‍යාපන සහතිකවල මුල් පිටපත් පරීක්ෂා කර බලා වගකීමකින් යුතුව සහතික කරමි.** තව ද නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
අත්සන හා සුදුසුකම් සහතික කරන අයගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————.
නම :————.
නිල නාමය :————.
ලිපිනය :————.

04-479

---

**වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

**ඉංජිනේරු තාක්ෂණ ආයතනය (පෙර තාක්ෂණඥයින් පුහුණු කිරීමේ ආයතනය) - කටුනායක**
***ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ඉංජිනේරු විද්‍යා විශේෂ ආධුනිකයින් බඳවා ගැනීම - 2010 කණ්ඩායම***

කටුනායක, ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ (පෙර තාක්ෂණඥයින් පුහුණු කිරීමේ ආයතනය) ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා පාඨමාලාව, 2010 කණ්ඩායම සඳහා ඉංජිනේරු විද්‍යා විශේෂ ආධුනිකයින් බඳවා ගැනීම පිණිස ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් මෙයින් අයැදුම්පත් කැඳවනු ලැබේ.

1. *ඇතුළත් කර ගැනීම සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :*

පහත දක්වා ඇති සුදුසුකම් සහිත අයැදුම්කරුවන්ට අයැදුම්පත් ඉදිරිපත් කළ හැක.

1.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී විද්‍යාව, ගණිතය සහ භාෂාව යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් 06කින් සාමාර්ථය ලබා සිටීම ; සහ

1.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ - නව නිර්දේශය) විභාගයේ දී සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව යන විෂයයන් තුන (03) එකවර සමත්වීම.

2. *වයස.-* 2010.12.01 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 25ට නොවැඩි විය යුතුය.

3. *පුහුණු කිරීමේ කාලය පිළිබඳ වැඩසටහන් විස්තර :*

මෙම පාඨමාලාවේ කාලය වසර හතරකි. මාස 18ක න්‍යායික උපදෙස් පාඨමාලාව, මාස 30ක ප්‍රායෝගික පුහුණුව සමග පහත දැක්වෙන ආකාරයට සකස් කර ඇත :-

| | |
|---|---|
| මූලික උපදෙස් වැඩසටහන<br>ඉංජිනේරු තාක්ෂණ (ඉ.තා.) ආයතනයේ දී | - මාස 06 |
| මූලික ආයතනික ක්ෂේත්‍ර පුහුණුව<br>කර්මාන්ත ආයතනයේ දී | - මාස 12 |
| සාමාන්‍ය උපදෙස් වැඩසටහන<br>ඉ. තා. ආයතනයේ දී | - මාස 06 |
| සාමාන්‍ය ආයතනික ක්ෂේත්‍ර පුහුණුව<br>කර්මාන්ත ආයතනයේ දී | - මාස 12 |
| විශේෂ උපදෙස් වැඩසටහන<br>ඉ. තා. ආයතනයේ දී | - මාස 06 |
| විශේෂ ආයතනික ක්ෂේත්‍ර පුහුණුව<br>කර්මාන්ත ආයතනයේ දී | - මාස 06 |

මෙම ඉංජිනේරු පාඨමාලාවට අයත් න්‍යායික උපදෙස් හා පාඨමාලා ප්‍රායෝගික කාර්යයන් මෙම ආයතනයේදී ලබා දෙන අතර ආයතනික ක්ෂේත්‍ර පුහුණුව පිළිගත් කර්මාන්ත ආයතන මගින් ලබා දෙනු ඇත.

පාඨමාලාව ආරම්භ කිරීමට ප්‍රථම පැය 100ක කඩිනම් ඉංග්‍රීසි පාඨමාලාවක් පවත්වනු ලබන අතර එයට තෝරාගත් සියළුම ආධුනිකයින්ගේ සහභාගිත්වය අනිවාර්ය වේ.

4. ආයතනය මගින් පවත්වනු ලබන පාඨමාලා පහත සඳහන් පරිදි වේ :-

*(අ) සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රය :*
1. ගොඩනැගිලි හා ව්‍යුහ ඉංජිනේරු පාඨමාලාව
2. මහාමාර්ග හා දුම්රිය මාර්ග ඉංජිනේරු පාඨමාලාව
3. ජල හා පාරිසරික ඉංජිනේරු පාඨමාලාව

*(ආ) විදුලි ඉංජිනේරු ක්ෂේත්‍රය :*
4. විද්‍යුත් ඉංජිනේරු පාඨමාලාව
5. විදුලිබල ඉංජිනේරු පාඨමාලාව
6. විදුලි සංදේශ ඉංජිනේරු පාඨමාලාව

*(ඇ) යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රය :*
7. යාන්ත්‍රික (ස්වයංචලන) ඉංජිනේරු පාඨමාලාව
8. යාන්ත්‍රික (සාමාන්‍ය) ඉංජිනේරු පාඨමාලාව
9. නාවික ඉංජිනේරු පාඨමාලාව

*(ඈ) පරිගණක ඉංජිනේරු ක්ෂේත්‍රය :*
10. පරිගණක මෘදුකාංග ඉංජිනේරු පාඨමාලාව
11. පරිගණක දෘඩාංග හා ජාලකරණ ඉංජිනේරු පාඨමාලාව

*(අ)* ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ නාවික ඉංජිනේරු පාඨමාලාව (අංක 9) තත්ත්ව කළමනාකරණ පද්ධතිය ISO 9001-2000 හි දක්වා ඇති අවශ්‍යතා පරිදි පැවැත්වේ.

*(ආ)* නාවික ඉංජිනේරු පාඨමාලාව සැලසුම් කොට ඇත්තේ අන්තර්ජාතික සමුද්‍ර සංවිධානයේ STCW-95 සහ 7.04 ආදර්ශ පාඨමාලාව හා සම්බන්ධිත නාවික ඉංජිනේරු කාරක මට්ටමේ දැනුම, අවබෝධය සහ ප්‍රවීණතාව පිළිබඳ විධානානුකූල අවශ්‍යතා සපුරාලනු පිණිස වේ.

5. *උපදෙස් මාධ්‍යය.-* මෙම පාඨමාලා පවත්වනු ලබන්නේ ඉංග්‍රීසි භාෂාවෙනි.

6. *ආධුනිකත්ව ගිවිසුම :*

6.1 තෝරාගනු ලබන සෑම ආධුනිකයෙකු විසින්ම ආධුනිකයා, ඉංජිනේරු තාක්ෂණ ආයතනය සහ පුහුණු කිරීමේ ආයතනය යන තිදෙනා වෙතම අන්‍යොන්‍යය වගකීම් පැවරෙන විශේෂ ආධුනිකත්ව ගිවිසුමකට ඇතුළත් විය යුතු අතර පාඨමාලාවට ලියාපදිංචි වන අවස්ථාවේ දී, පාඨමාලාව අවසානයේ ආපසු ගෙවනු ලබන රුපියල් 5,000ක තැන්පතු මුදලක් ලබා දිය යුතුය. පාඨමාලාව අතරමග හැර යන සිසුන්ට මෙම මුදල ආපසු ගෙවනු නොලැබේ.

6.2 කර්මාන්ත පුහුණු අවස්ථාවල දී ආධුනිකයා සහ පුහුණු ආයතනය අතර ආධුනිකත්ව ගිවිසුමකට ඇතුළත් විය යුතුය.

6.3 පුහුණුව අවසාන වීමෙන් පසුව ආධුනිකයින් සඳහා රැකියා සැපයීමට ආයතනය බැඳී නොමැත.

6.4 මෙම පාඨමාලා සඳහා ලියාපදිංචිවන සියළුම සිසුන් මුළු පාඨමාලා කාලය තුළ 80% අවම පැමිණීමේ ප්‍රතිශතයක් පවත්වාගෙන යා යුතුය. එසේ නොවන අවස්ථාවල දී අදාල විභාගවලට පෙනී සිටිය නොහැකි අතර ඔවුන්ට එම කණ්ඩායමෙන් ඉවත්වී පසු කණ්ඩායම සමග අධ්‍යයන කටයුතු කිරීමට සිදුවේ.

7. *සහතික ප්‍රදානය.-* සාර්ථක ලෙස පුහුණුව අවසන් කර සමත්වන ආධුනිකයින් හට ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා සහතිකය ප්‍රදානය කරනු ඇත.

8. *තෝරාගැනීමේ ක්‍රමය :*

8.1 ඉහත අංක 1 ඡේදයෙහි සඳහන් ඇතුළත් කරගැනීම සඳහා වූ අවම සුදුසුකම් සහිත අංක 2 ඡේදයෙහි සඳහන් වයස් සීමාව තුළ වූ අයැදුම්කරුවන්ගෙන් පහත දැක්වෙන ක්‍රමයට තෝරාගැනීම සිදුකරනු ලැබේ.

8.2 මූලික සුදුසුකම් සපුරා ඇති සියලුම අයැදුම්කරුවන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් වූ ලිඛිත යෝග්‍යතා පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. (ලිඛිත යෝග්‍යතා පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබන සියලුම අයැදුම්කරුවන් වෙත කල්වේලා ඇතිව ඒ බව දැනුම් දෙනු ලැබේ).

8.3 ලිඛිත පරීක්ෂණයෙන් ලබාගත් ලකුණු හා සම්මුඛ පරීක්ෂණයක් මගින් විවිධ ක්ෂේත්‍ර/විශේෂිකරණ සඳහා ආධුනිකයින් තෝරාගනු ඇත.

8.4 නාවික ඉංජිනේරු ක්ෂේත්‍රය සඳහා තෝරාගනු ලැබූ අයැදුම්කරුවන් ඔවුන් එම ක්ෂේත්‍රයේ ලියාපදිංචි වීමට පෙර ඔවුන්ගේ වියදමින් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය.

9. *අයැදුම්පත් :*

9.1 අයැදුම්පත් සහ ආයතනය පිළිබඳ වැඩි විස්තර www.iet.edu.lk යන වෙබ් අඩවියෙන් ලබා ගත හැක; තව ද,

9.2 කටුනායක, පන්සල පාරේ, ඉංජිනේරු තාක්ෂණ ආයතනයට පැමිණ රු. 100ක් ගෙවීමෙන් හෝ තැපෑලෙන් අවශ්‍ය නම් රු. 100ක් වටිනා මුදල් ඇණවුමක් සහ රු. 5ක් වටිනා මුද්දර ගැසූ ලිපිනය ලියන ලද අඟල් 9x4 ප්‍රමාණයේ ලියුම් කවරයක් ලේඛකාධිකාරි, ඉංජිනේරු තාක්ෂණ ආයතනය, පන්සල පාර, කටුනායක (දුරකථන අංක 011-2252833, 011-2252834) යන ලිපිනයට එවීමෙන් 2010 ජුනි මස 18 වැනි දින දක්වා අයැදුම්පත් ලබාගත හැක. මුදල් ඇනවුම් : ගණකාධිකාරි, ඉංජිනේරු තාක්‍ෂණ ආයතනය නමින් ලබාගතයුතු අතර ගෙවීම් කරන තැපැල් කාර්යාලය 'කටුනායක' විය යුතුයි.

9.3 මෙයට අමතරව පහත දැක්වෙන කාර්යාලවලට පැමිණ රු. 100ක් ගෙවීමෙන් ද, 2010 ජුනි මස 18 වැනි දින දක්වා අයැදුම්පත් මිල දී ගත හැක.

(i) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 971, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය.
*දුරකථනය :* 011-2863680, 011-2867435

(ii) ආධුනිකත්ව අභ්‍යාස ආයතනය, අංක 581, ගාලුපාර, කටුබැද්ද, මොරටුව.
*දුරකථනය :* 011-2647393, 011-2641092

(iii) මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය, 07,දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, ඔරුගොඩවත්ත, වැල්ලම්පිටිය.
*දුරකථනය :* 011-2572977, 011-2532182

(iv) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, ඌව පළාත් කාර්යාලය, අංක 288, කුමාරසිංහ මාවත, පස්සර පාර, බදුල්ල.
*දුරකථනය :* 055-2222608

(v) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, සබරගමුව පළාත් කාර්යාලය, නව කොළඹ පාර, විද්‍යාල මාවත, නව නගරය, රත්නපුර.
*දුරකථනය :* 045-2228667

(vi) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, දකුණු පළාත් කාර්යාලය, අංක 27ඒ, විවෘත විශ්වවිද්‍යාල මාවත, නූපේ, මාතර.
*දුරකථනය :* 041-2226985

(vii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය, අංක 108/2බී, තිවංක බෝධි මාවත, මුල්ගම්පොළ, මහනුවර.
*දුරකථනය :* 081-2201918

(viii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, උතුරු මැද පළාත් කාර්යාලය, දෙවන පියවර, ගුවන් තොටුපල පාර, අනුරාධපුරය.
*දුරකථනය :* 025-2223178

(ix) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, වයඹ පළාත් කාර්යාලය, ජාතික තරුණ සේවා සභාව අසල, මීගමුව පාර, මල්කඩුවාව, කුරුණෑගල.
*දුරකථනය :* 037-2221865/037-2223789

(x) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, උතුරු පළාත් කාර්යාලය, අංක 07, කෝවිල පාර, යාපනය.
*දුරකථනය :* 021-2222383

(xi) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, නැගෙනහිර පළාත් කාර්යාලය, අංක 06, ග්‍රාමසේවක පාර, කල්මුනේ කුඩි 13, කල්මුනේ.
*දුරකථනය* : 067-2229357

(xii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, බස්නාහිර පළාත් කාර්යාලය, අංක 242, හැව්ලොක් පාර, කොළඹ 05.
*දුරකථනය* : 011-2597671-2, 011-2587258

දිස්ත්‍රික් කාර්යාල :

(i) විදුලි සංදේශ හා පරිගණක පුහුණු මධ්‍යස්ථානය, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, බේරුවල.
*දුරකථනය* : 034-2279710

(ii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 56, ආනන්ද මාවත, ගම්පහ.
*දුරකථනය* : 033-2227501

(iii) දිස්ත්‍රික් කාර්යාලය (පුත්තලම), පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, ඉහළගම, මාදම්පේ.
*දුරකථනය* : 032-2247776

(iv) පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, අංක ඒ/6, මහවැලි නිල නිවාසය, නව නගරය, පොළොන්නරුව.
*දුරකථනය* : 027-2223023

(v) පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, කච්චේරිය, මොණරාගල.
*දුරකථනය* : 055-2276504

(vi) පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, අංක 1/6, ඉහළ වැව පාර, නුවරඑළිය.
*දුරකථනය* : 071-4408182

(vii) පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, අංක 32, මල්වත්ත පාර, මාතලේ.
*දුරකථනය* : 066-2230355

(viii) දිස්ත්‍රික් කාර්යාලය, කෑගල්ල, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, අංක 450 - ඒ, නුවර පාර, මීපිටිය, කෑගල්ල.
*දුරකථනය* : 035-2223127

(ix) ශ්‍රී සරණංකර ආධුනිකත්ව පුහුණු ආයතනය, උඩවත්ත, බද්දේගම.
*දුරකථනය* : 091-5677388

(x) පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, අංක 14, ඉඳිපොකුණගොඩ පාර, තංගල්ල.
*දුරකථනය* : 047-2241512

(xi) පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, අංක 06 ජී/එස් පෙදෙස, කල්මුනිකුඩයි 13, කල්මුනේ.
*දුරකථනය* : 067-2229357

(xii) පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, අංක 33/1, ප්‍රධාන වීදිය, ත්‍රිකුණාමලය.
*දුරකථනය* : 026-2222891

(xiii) පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, අංක 16/1, නව කල්මුනෙයි පාර, මඩකලපුව.
*දුරකථනය* : 071-6894457

(xiv) පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, අංක 27/4/4, පදනිච්චිපුලියන්කුලම, මන්නාරම පාර, වවුනියාව.
*දුරකථනය* : 024-2220442

(xv) පරිගණක ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය, අංක 25, ප්‍රධාන පාර, "කොටුව", මන්නාරම.
*දුරකථනය* : 021-2222383

9.4 සෑම අයැදුම්කරුවෙකු විසින්ම තම අයදුම්පත ඉදිරිපත් කිරීමේ දී නැවත නොගෙවන රු. 500ක මුදලක් (9.5 ප්‍රකාර) ගෙවිය යුතු ය. මෙම මුදල දිවයිනේ පිහිටි මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකට ගෙවිය හැකි ය.

9.5 මුදල් තැන්පතු තුණ්ඩුව පහත සඳහන් කරුණු සහිතව නිසි පරිදි සම්පූර්ණ කළ යුතු ය :-
(i) *ශාඛා අංකය සහ ගිණුම් අංකය* : 267-1-001-2-4535909.
(ii) *බැර උපදෙස්.-* මහජන බැංකුව, කටුනායක, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ රැස් කිරීමේ ගිණුම් අංක 267-1-001-2-4535909 ට බැර පිණිස.
(iii) අයදුම්කරුගේ නම සහ ලිපිනය.

9.6 අයදුම්පත වෙබ් අඩවියෙන් ලබාගන්නා අයදුම්කරුවන් විභාග ගාස්තු ලෙස රු. 600ක් ගෙවිය යුතුවේ.

9.7 නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත, මුදල් ගෙවීම් කරන ලද බැංකු ශාඛාවේ බලයලත් නිලධාරියෙකු විසින් සහතික කරන ලද තැන්පතු රිසිට්පත, අයදුම්පත සමග අමුණා 2010 ජූනි මස 18 වැනි දින හෝ ඊට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් අධ්‍යක්ෂ/විදුහල්පති, ඉංජිනේරු තාක්ෂණ ආයතනය, පන්සල පාර, කටුනායක යන ලිපිනයට එවිය යුතු ය. කවරයේ වම්පස කෙළවරේ "විශේෂ ආධුනිකයන් බඳවා ගැනීම - 2010 අයදුම්පත " ලෙස සටහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හෝ අතින් ගෙනැවිත් භාර දෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

රජයේ කාර්මික ආයතනයක හෝ විශ්වවිද්‍යාලයක පූර්ණ කාලීන ඩිප්ලෝමා පාඨමාලාවක් හෝ උපාධිය හැදෑරූ හෝ හදාරමින් සිටින අයට මේ සඳහා අයදුම්කල නොහැක.

9.8 අයදුම්පත සමග සහතිකවල මුල් පිටපත් හෝ ඡායා පිටපත් එවිය යුතු නැත.

9.9 අයදුම්පත් ලැබුණු බවට අයදුම්කරුවන්ට දැනුම් දෙනු නොලැබේ.

10. තැපෑලේ දී නැතිවන හා ප්‍රමාද වන අයදුම්පත් සම්බන්ධයෙන් ඉංජිනේරු තාක්ෂණ ආයතනය වග කියනු නොලැබේ. ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා කල් ඇතිව සිය අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ට විශේෂයෙන් දන්වා සිටිනු ලැබේ.

සභාපති,
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය.

අංක 971,
ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

04-561

---

## ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය - මොරටුව
## (ප්‍රවාහන අමාත්‍යාංශය)

### ජාතික ආධුනිකත්ව ක්‍රමය යටතේ පූර්ණ කාලීන පාඨමාලා සඳහා ඇතුළත් කර ගැනීම — 2010 වර්ෂය

2010 වර්ෂය සඳහා ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයට ඇතුළත් කර ගැනීමට පහත සඳහන් අවම සුදුසුකම් සපුරා ඇති ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

1. (*අ*) වයස : 2010.03.31 වැනි දිනට අවුරුදු 16 ත් 22 ත් අතර විය යුතුය.

(*ආ*) අධ්‍යාපන සුදුසුකම් :
අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී (අධ්‍යයන මාධ්‍යය අනුව) සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් 06ක් එකවර සමත්වීම.

*විශේෂ කුසලතා* :
විදුලි/විද්‍යුත්/යාන්ත්‍රික යන ක්ෂේත්‍රයකින් නව නිර්මාණ ඉදිරිපත් කර නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මගින් පවත්වන පළාත් මට්ටමේ තරඟ වලින් ප්‍රථම ස්ථාන 03 අතරට පැමිණ සහතික ලබා ඇති හෝ ජාතික මට්ටමේ තරඟ වලින් කුසලතා සහතිකයක් ලබා විශේෂ දක්ෂතා දක්වා ඇති අය සඳහා අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී (අධ්‍යයන මාධ්‍යය අනුව) සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් 06කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්වීම. (මෙම පදනම මත සීමිත සංඛ්‍යාවක් බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.)

(*ඇ*) *සැ. යු.*— පහත නම් සඳහන් පුහුණු ආයතනවල දැනට පූර්ණ කාලීන පාඨමාලා හදාරන ආධුනික/ආධුනිකාවන්ට මෙම පුහුණුව සඳහා ඉල්ලුම් කළ නොහැක.

(i). ආධුනිකත්ව අභ්‍යාස ආයතනය - මොරටුව.
(ii). මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය, ඔරුගොඩවත්ත.
(iii). ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය අභ්‍යාස ආයතනය, රත්මලාන.

2. *ඇතුළත් වීමේ විභාගය පවත්වන මාධ්‍යය.*—සිංහල සහ දෙමළ භාෂා වලින්

*පුහුණු පාඨමාලා පවත්වන මාධ්‍යය.*—සියළුම පාඨමාලා සිංහල මාධ්‍යයෙන් පවත්වන අතර දැනට තිබෙන පහසුකම් අනුව මෝටර් කාර්මික ශිල්පය පමණක් දෙමළ මාධ්‍යයෙන් ද පැවැත්වේ.

3. *විභාග මධ්‍යස්ථාන* :
තෝරාගත් අයදුම්කරුවන් සඳහා ලිඛිත පරීක්ෂණයක් කොළඹ, මහනුවර, ගාල්ල, බදුල්ල, අනුරාධපුරය, ත්‍රිකුණාමලය සහ යාපනය යන විභාග මධ්‍යස්ථාන වල දී පැවැත්වේ. එහෙත් මීට අමතරව යම් පළාතක විභාග අයදුම්කරුවන් 100කට වැඩි ප්‍රමාණයක් සිටීනම් එම පළාතේ විභාග මධ්‍යස්ථානයක් පැවැත්වීමට කටයුතු කරනු ඇත. අවශ්‍ය අවම සුදුසුකම් සපුරා ඇති හා අංක 04 සඳහන් විභාග ගාස්තු එවා ඇති අයදුම්කරුවන් පමණක් ඇතුළත් කිරීමේ විභාගයට කැඳවනු ලැබේ.

*විභාගයට අදාළ විෂයයන්* :
ඇතුළත්වීමේ විභාගය ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වන අතර ගණිතය, සාමාන්‍ය දැනීම, බුද්ධි පරීක්ෂණය සහ කාර්මික ඇඳීම යන විෂයයන් පදනම් කර සකස් කරනු ලැබේ.

4. *විභාග ගාස්තු.*—විභාග ගාස්තු වශයෙන් රු. 350ක් ගෙවිය යුතු අතර එම මුදල ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් ගෙවිය හැකිය.

*ගෙවන ක්‍රමය.*—ගණකාධිකාරී, ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය,
ලංකා බැංකුව, මොරටුව ශාඛාවේ, ගිණුම් අංක 681490 දරන ගිණුමට මුදල් බැර කල යුතු අතර ලදුපත අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය.

විභාග ගාස්තු ගෙවා ලබා ගත් කුවිතාන්සිය අමුණා නොඑවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඇතුළත්වීමේ විභාගයට පෙනී නොසිටීම නිසා හෝ වෙනත් කිසිම හේතුවක් නිසා හෝ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන බව විශේෂයෙන් සැලකිය යුතුය.

5. *මූලික තෝරාගැනීම* :

ලිඛිත පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතරින් ප්‍රමුඛතා පදනම මත සීමිත සංඛ්‍යාවක් අවසාන තෝරා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. යෝග්‍යතා සහ සම්මුඛ පරීක්ෂණයට අයදුම්කරුවන් කැඳවීමේ දී අඩු පහසුකම් සහිත පළාත් සඳහා තෝරා ගැනීමේ ලකුණු මට්ටම ආයතනය මගින් තීරණය කරනු ඇත. (අඩු පහසුකම් ඇති ප්‍රදේශ ලෙස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව නිර්දේශ කරනු ලබන පළාත් පමණක් සලකනු ලැබේ.)

6. අවසන් තෝරා ගැනීම :
යෝග්‍යතා හා සම්මුඛ පරීක්‍ෂණයෙන් ලබා ගන්නා ලද ඉහළම ලකුණු ප්‍රමාණය මත බඳවා ගනු ලබන සංඛ්‍යාව තීරණය කරනු ඇත. ලකුණු ලබා දෙනු ලබන්නේ යෝග්‍යතා පරීක්‍ෂණය සඳහා 40%ක් ද සම්මුඛ පරීක්‍ෂණය සඳහා 60%ක් ද, වශයෙනි. පුහුණුව සඳහා ආයතනයට බඳවා ගත හැකි සංඛ්‍යාව සීමිත බැවින් අයදුම්කරුවන්ගේ බාහිර කුසලතා කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

අදාළ පරීක්‍ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්‍ෂණයකට යටත්ව පුහුණුව සඳහා තෝරා ගනු ලබන අතර වෛද්‍ය පරීක්‍ෂණයෙන් අසමත් වන අයදුම්කරුවන් පුහුණුවෙන් ඉවත් කරනු ලබන බව සැලකිය යුතුය.

7. පුහුණු පාඨමාලා :

| | |
|---|---|
| මෝටර් කාර්මික ශිල්පය | - අවු. 04 |
| මිල්රයිට් වැද්දුම් ශිල්පය | - අවු. 04 |
| වායු සමීකරණ/ශීතකරණ ශිල්පය | - අවු. 03 1/2 |
| බල විදුලි ශිල්පය | - අවු. 03 1/2 |
| යන්ත්‍රණ ශිල්පය | - අවු. 03 1/2 |
| ඩීසල් එන්ජින් යාන්ත්‍රික ශිල්පය | - අවු. 03 |
| වාහන විදුලි ශිල්පය | - අවු. 03 |
| පෑස්සුම් ශිල්පය | - අවු. 03 |
| මෝටර් වාහන, බොඩි අළුත් වැඩියාකරු හා පින්තාරුකරු | - අවු 03 |

මෙම පුහුණු පාඨමාලා හැදෑරීමට අවස්ථාව ලබා දෙනුයේ ප්‍රථම වසරේ දී මූලික පුහුණු පාඨමාලාව අවසානයේ පැවැත්වෙන වෘත්තීය තෝරා ගැනීමේ පරීක්‍ෂණයේ දී දක්වන කුසලතාවන්ගේ ප්‍රතිඵල අනුවය.

8. ගිවිසුම් අත්සන් කිරීම :

ආයතනයේ පුහුණුවට තෝරා ගනු ලබන සියලුම අයදුම්කරුවන්ට ලැබෙන ඒ ඒ වෘත්තීන්ට අදාළව අවු. 04,03 1/2 සහ 03ක් වූ පාඨමාලා සාර්ථකව හදාරන බවට මෙම අයාතනය සහ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය සමඟ ගිවිසුමකට එළඹිය යුතුය.

ඊට අමතරව ආයතනීය සාර්ථක පුහුණුවෙන් පසු වසර 02ක් ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සේවය කරන බවට ආයතනය සමඟ බැඳුම්කරයකට අත්සන් තැබිය යුතුය.

9. අයදුම්පත් :
පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුව (මි. මී. 210 x 297 A4 ප්‍රමාණය) තම අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතු අතර අයදුම්පත්‍රය සමඟ පහත දැක්වෙන සහතික වල ඡායා පිටපත් ද අමුණා එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය;

(ආ) අධ්‍යාපන සහතික;

(ඇ) ඉහත අංක 1 හි විශේෂ කුසලතා යටතේ අයදුම් කරන අයදුම්කරුවන් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මඟින් නිකුත් කර ඇති පලාත්/ජාතික මට්ටමේ සහතිකය.
අයදුම්පත් එවීමේ දී ලියුම් කවරයේ ඉහල වම් කෙලවරේ "පූර්ණ කාලීන ආධුනිකයින් බඳවා ගැනීම - 2010" යනුවෙන් සඳහන් කල යුතුය.
(අයදුම්පත් www. egtti.slt.lk දරන ආයතනීය වෙබ් අඩවියෙන් ද ලබා ගත හැකිය.)

10. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය :

අයදුම්පත් 2010.06.04 වැනි දින හෝ එදිනට ප්‍රථම ලැබෙන සේ කළමනාකාර - මානව හා සම්පත් පරිපාලන වෙත ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්‍ෂේප කරනු ලැබේ.

කළමනාකාර - මානව සම්පත් හා පරිපාලන
ලං. ජ. කා. අ. ආ

ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය,
අංක 582, ගාලු පාර, ගල්කිස්ස,
(අඟුලාන හංදිය අසල)
දුරකථන අංකය : 0112-605625.

**ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය - මොරටුව**

***ජාතික ආධුනිකත්ව ක්‍රමය යටතේ පූර්ණ කාලීන පාඨමාලා සඳහා ඇතුළත් කර ගැනීම - 2010 වර්ෂය***

01. (අ) සම්පූර්ණ නම (සිංහලෙන්) :————.
(ඉංග්‍රීසියෙන්) :————.
(ආ) මුලකුරු සමඟ නම :————.

02. (අ) තැපැල් ලිපිනය (ඉංග්‍රීසියෙන්) :————.
(ආ) දිස්ත්‍රික්කය :————. (ඇ) පළාත :————.

03. (අ) උපන් දිනය :————.
(ආ) 2010.03.31 දිනට වයස : අවු. :————. මාස :————.
දින :————.
(ඇ) ජාතික හැඳුනුම්පත් අංකය :————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

05. අධ්‍යාපන සුදුසුකම් (අ. පො. ස. සාමාන්‍ය පෙළ) :

| පළමු වර | | දෙවන වර | |
|---|---|---|---|
| විභාග අංකය : | වර්ෂය : | විභාග අංකය : | වර්ෂය : |
| *විෂයයන්* | *සාමාර්ථය* | *විෂයයන්* | *සාමාර්ථය* |
| ..................... | ...... | ..................... | ...... |
| ..................... | ...... | ..................... | ...... |
| ..................... | ...... | ..................... | ...... |
| ..................... | ...... | ..................... | ...... |
| ..................... | ...... | ..................... | ...... |
| ..................... | ...... | ..................... | ...... |
| ..................... | ...... | ..................... | ...... |
| ..................... | ...... | ..................... | ...... |
| ..................... | ...... | ..................... | ...... |

06. විශේෂ දක්ෂතා යටතේ අයදුම් කරන්නේ නම් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිෂම මගින් නිකුත් කල පළාත්/ජාතික මට්ටමේ සහතිකය නිකුත් කල වර්ෂය හා ක්ෂේත්‍රය :—————.

07. (අ) අයදුම්කරු විභාගයට පෙනී සිටීමට කැමති මාධ්‍යය :————.

(ආ) අයදුම්කරු විභාගයට පෙනී සිටීමට කැමති විභාග මධ්‍යස්ථානය :————.

(කොළඹ, මහනුවර, ගාල්ල, බදුල්ල, අනුරාධපුරය, ත්‍රිකුණාමලය හා යාපනය)

08. i. මුදල් ගෙවූ ලංකා බැංකු ශාඛාවේ නම :—————.

ii. මුදල් ගෙවූ දිනය :—————.

09. ඉහත සඳහන් කර ඇති විස්තර සත්‍ය බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් විස්තර වලින් යමක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව මා තෝරා ගැනීමට පෙර හෝ තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් පුහුණුවෙන් ඉවත් කිරීමට හැකි බව දනිමි.

—————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :—————.

04-564